# සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

## ප්‍රාසංගික කලාවේදී (ගෞරව) උපාධි දෙවන වසර පරීක්ෂණය - 2019/2020

## නර්තන හා නාට්‍ය කලා පීඨය

## <u>තොරතුරු සාක්ෂරතාව – DHTD 22042</u>

කාලය :- පැ 03

❖ සැ.යු :- පිළිතුරු ලිවීම ආරම්භ කිරීමට පෙර දී ඇති උපදෙස් හොඳින් කියවන්න.

---

❖ මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න අටකින් (08) සමන්විත ය.
❖ <u>ප්‍රශ්න පහකට (05) පමණක්</u> පිළිතුරු සපයන්න.
❖ සෑම ප්‍රශ්නයක් සඳහාම පිළිතුරු අලුත් පිටුවකින් ආරම්භ කරන්න.
❖ සියලුම ප්‍රශ්න සඳහා සමාන ලකුණු ලැබේ. (ලකුණු 20)

---

01. තොරතුරු කුසලතාව යනු කුමක්දැයි හඳුන්වා පර්යේෂණ සහ අධ්‍යයන කාර්යන්හිදී, තොරතුරු කුසලතාව සංවර්ධනය කිරීම තුළින් ලැබෙන පිටුවහල විස්තර කරන්න. (ලකුණු 20)

02. අ.) තොරතුරු කුසලතාව ප්‍රගුණ කරන ලද අයෙකු තුළ ගොඩනැගෙන වෙනත් කුසලතා කවරේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 10)
ආ.) ගැටලු විසදීමේ හැකියාව (problem solving skill) සහ කාර්ය කළමනාකරණ හැකියාව (task management skill) විද්‍යාර්ථියෙකුට වැදගත් වන්නේ කෙසේදැයි විස්තර කරන්න. (ලකුණු 10)

03. අධ්‍යයන හා ශාස්ත්‍රීය කටයුතු සඳහා තොරතුරු ගවේෂණය කිරීමේදී පාඨකයාගේ පහසුව පිණිස පුස්තකාල විසින් සපයා ඇති සේවාවන් මොනවාදැයි විස්තර කරන්න. (ලකුණු 20)

04. අ.) තොරතුරු මූලාශ්‍ර යනු මොනවාද? (ලකුණු 10)
ආ.) පර්යේෂණ කටයුතුවලදී ප්‍රාථමික තොරතුරු මූලාශ්‍රවල වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 10)

05. තොරතුරු ඉදිරිපත් කිරීම/ සන්නිවේදනය කිරීම (presentation/ communication) තොරතුරු කුසලතාවයේ වැදගත් පියවරකි. තොරතුරු කාර්යය සාර්ථක කර ගැනීම සඳහා තොරතුරු මනා ලෙස ඉදිරිපත් කිරීම වැදගත් වන්නේ කෙසේදැයි තොරතුරු කුසලතාවයේ ප්‍රධාන පියවර ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 20)

06. තොරතුරු ගවේෂණය කිරීමේදී සහ භාවිත කිරීමේදී තොරතුරු මූලාශ්‍ර අගය කිරීම අත්‍යාවශ්‍ය කාර්යයකි. තොරතුරු මූලාශ්‍රයක් අගය කිරීමේ නිර්ණායක (Evaluation criteria) ඇසුරින් මෙම කියමන සනාථ කරන්න. (ලකුණු 20)

07. අ.) බුද්ධිමය හිමිකම (copyright) යනු කුමක්ද? (ලකුණු 05)
ආ.) "තොරතුරු භාවිත කිරීමේ දී තොරතුරු චෞරත්වය (plagiarism) වළක්වා ගනිමින් ආචාරශීලි අන්දමින් තොරතුරු භාවිත කිරීම (ethical of information) ශාස්ත්‍රීය පිළිගැනීම (Academic integrity) පවත්වාගෙන යාම සඳහා අත්‍යවශ්‍ය වේ." පැහැදිලි කරන්න. (ලකුණු 15)

08. පහත සඳහන් මාතෘකා හතරක් පිළිබඳව කෙටි සටහන් ලියන්න. (ලකුණු 5x4=20)
i. සන්නිවේදන හැකියාව (communication skill)
ii. ඉලෙක්ට්‍රොනික පොත් (Electronic books)
iii. තොරතුරු චෞරත්වය (plagiarism)
iv. යාවජීව අධ්‍යාපනය (lifelong education)
v. සෙවුම් උපක්‍රම (Searching techniques)
vi. තොරතුරු සේවා (Information services)

………………….

2023.07.04